මාගේ අංකය - DIG/SSCO/Out/ 754/2024,
නියෝජ්‍ය පොලිස්පති,
හිටපු ජනාධිපතිවරුන්ගේ හා ජනාධිපති අපේක්ෂකයින්ගේ
ආරක්ෂාව අධීක්ෂණ සම්බන්ධීකරන කාර්යාලය.
2024.09.13

ජනාධිපති අපේක්ෂක
පාක්‍ය සෙල්වම් අරියනේත්‍රන් මැතිතුමා.

<u>තර්ජන වාර්තාවේ සඳහන් කරුණු ඉදිරිපත් කිරීම</u>

ශීර්ෂ ගත කරුණට අදාලව 2024.09.11 වන දින ජාතික බුද්ධි ප්‍රධානී මේජර් ජෙනරාල් ජෙ.ආර් කුලතුංග RPS මහතා විසින් මහජන ආරක්ෂක අමාත්‍යංශයේ ගරු ලේකම් තුමා වෙත යොමු කරන ලද MOD/NID/SD/TA/2(VOL-03-54) ලිපිය හා බැදේ.

2024 ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වී සිටින ඔබ තුමාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් එල්ලවිය හැකි තර්ජන වල ස්වභාවය මෙවර මැතිවරණයේදී ඔබ තුමා හට ඇති ජනප්‍රිය තාවය මත ජීවිතයට යම් තර්ජනයක් එල්ල වුව හොත් එමගින් සමස්ත මැතිවරණ ප්‍රතිඵලය වෙත එල්ලවිය හැකි බලපෑම මත කරන ආරක්ෂක බුද්ධි වාර්තාව ඔබ තුමා වෙත යොමු කරන අතර ඉදිරියේදි සහභාගී වන මහජන හමු හා උත්සව වල ආරක්ෂාව සම්බන්ධව කටයුතු කිරීමේදී එම කරුණු සම්බන්ධව අවධානය යොමු කරන ලෙස කරුණාවෙන් දන්වා සිටිමි.

බුද්ධි තක්සේරු වාර්තාවේ සඳහන් කරුණු වලට අදාලව ඔබ තුමා ජනාධිපතිවරණය සඳහා දෙමළ පොදු අපේක්ෂකයකයා වශයෙන් මෙවර ඉදිරිපත්වීම හේතුවෙන් ඉලංගෛ තමිල් අරුසුකච්චි පක්ෂයේ සාමාජිකයින් වන පා.ම රාස මානික්කම් සානක් කියන් සහ පා.ම එම්.ඒ සුමන් තිරන් යන මහතුන් අප්‍රසාදයෙන් පසුවන බවට වාර්තා කර ඇත.

එබැවින් ඉහත කරුණට අමතරව සියළු අපේක්ෂකයන් හට පහත සඳහන් පොදු කරුණු යටතේ තර්ජන ඇති බැවින් ඒ සම්බන්ධයෙන් සැලකිලිමත්ව කටයුතු කරන මෙන් වැඩි දුරටත් ඉල්ලා සිටිමි.

1. ප්‍රධාන මාර්ගයන්ට ඉතා සමීපව වේදිකා ඉදි කිරීම /ජන රැලි පැවැත්වීම.
2. ප්‍රභූ වරයා හා ප්‍රභූ රථ මගින් ජනතාව සමීප වීම, කතාබහ කිරීම ඡායා රූප ගැනීම.
3. පොදු ස්ථාන රැස්වීම් සඳහා යොදා ගැනීම තුල ඕනෑම පුද්ගලයකු හට පරීක්ෂාවකින් තොරව ඇතුල්වීමේ හා පිටවීමේ හැකියාව. (උදා : සතිපොල)
4. මහජන හමු, උත්සව හා වෙනත් අවශ්‍යතාවයන් සඳහා බැහැරව යාමේදී ආරක්ෂක ක්‍රමවේදයන් අනුගමනය නොකර සිටීම. එවැනි අවස්ථා වලදී ලබා දී ඇති ප්‍රභූ ආරක්ෂක නිලධාරීන්ගේ උපදෙස් මත අවශ්‍ය ආරක්ෂක ක්‍රමවේද අනුගමනය කිරීම.
5. මහජන හමු හා උත්සව වලට සහභාගී වීමේදී ප්‍රතිවිරුද්ධ මත දරන පිරිස්ගේ හා නාඳුනන තැනැත්තන්ගේ, දැඩි මත දාරී පුද්ගලයන්, ස්වයං අභිප්‍රේරනය වූ අයකුගේ හෝ මානසික ව්‍යාකූල අයකු මගින් යම් කිසි ක්ෂණික ප්‍රහාරයක් ඇති වීමට ඇති හැකියාව.

එස්.එම්.වයි. සෙනෙවිරත්න
නියෝජ්‍ය පොලිස්පති
පොලිස් ශිෂ්‍යභට දිශාව

13 09 24

එස්.එම්.වයි සෙනවිරත්න
නියෝජ්‍ය පොලිස්පති,
හිටපු ජනාධිපතිවරුන්ගේ හා ජනාධිපති අපේක්ෂකයින්ගේ
ආරක්ෂාව අධීක්ෂණ සම්බන්ධීකරන කාර්යාලය.
පිටපත් : -

1. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තුමා මැතිවරණ - කා.දැ.ස
2. ගොනුවට